සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# අ.පො.ස.(සා.පෙළ) විභාගය- 2023 (2024)
## පෙරහුරු පරීක්ෂණය - ඉතිහාසය - I

**කාලය පැය 1**

**උපදෙස් :**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.

---

## I කොටස

01. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ දී තොරතුරු ලබාගත හැකි වැදගත් මූලාශ්‍රයක් වන දීපවංශයෙහි දැකිය හැකි ප්‍රධාන දුර්වලතාවයක් වන්නේ,
    1. මහසෙන් රජුගේ පාලන සමය අවසානය තෙක් තොරතුරු ඇතුළත් වීමයි.
    2. ශ්‍රී ලංකාවේ පැරණි සාහිත්‍ය මූලාශ්‍රයක් වීමයි.
    3. එකම තොරතුරු නැවත නැවත රචනා වී තිබීම ය.
    4. රචනා කරන ලද පුද්ගලයෙක් පිළිබඳ තොරතුරු සඳහන් නොවීම යි.

02. පහත සඳහන් මූලාශ්‍රය අතරින් රජරට ශිෂ්ටාචාර සමයේ ඉතිහාසය හැදෑරීමේදී වැදගත් වන කෘතිය කුමක් ද?
    1. පූජාවලිය 2. නිකාය සංග්‍රහය 3. කව්සිළුමිණ 4. රාජාවලිය

03. සකස් කරගත් ගල් කුළුණු මත රචනා කර ඇති සෙල්ලිපි වර්ගය කුමක් ද?
    1. පුවරු ලිපි 2. ටැම් ලිපි 3. ගිරි ලිපි 4. ලෙන් ලිපි

04. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගල් යුගය පිළිබඳ පැරණිතම සාධක හමුවන ස්ථානය වන්නේ,
    1. බුන්දල ය. 2. පාහියන්ගල ය.
    3. මිනිහාගල්කන්ද ය. 4. පතිරාජවෙල ය.

05. ශ්‍රී ලංකා ඉතිහාසයේ මුල් යකඩ යුගය ලෙස හඳුන්වනු ලබන්නේ,
    1. ගල් යුගය යි. 2. පූර්ව ඓතිහාසික යුගය යි.
    3. ප්‍රාග් ඓතිහාසික යුගය යි. 4. මුල් ඓතිහාසික යුගය යි.

06. මෙරට පූර්ව ඓතිහාසික යුගය බිහිවීමට බලපෑ ප්‍රධාන පාරිසරික සාධකය කුමක් ද?
    1. පරිසරය උණුසුම් වීම 2. පරිසරය අධික ලෙස සිසිල් වීම
    3. ස්ථිරවාසිතාවයට නැඹුරු වීම 4. ගොවිතැනට හුරු වීම

07. ගල්ලෙනක් පිරිසිදු කොට භික්ෂූන් වහන්සේලාට පූජා කරන ලද සුමන නම් ගෘහපතියෙක් පිළිබඳ තොරතුරු සඳහන් අභිලේඛනය කුමක් ද?
    1. කණ්ඩලම කොත්ගල්කන්ද සෙල්ලිපිය 2. පෙරියපුලියන්කුලම සෙල්ලිපිය
    3. වෙහෙරකෙම සෙල්ලිපිය 4. සිතුල්පව්ව කොරවක්ගල අසල සෙල්ලිපිය

08. දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ මෙරට දේශපාලන බලය මධ්‍යගත කිරීමේ අවශ්‍යතාවය ඇති කිරීමට බලපෑ ප්‍රධානතම හේතුව කුමක් ද?
    1. විදේශිකයන්ගේ අවධානය දිනාගත් වෙළඳ ද්‍රව්‍ය රැසක් මෙරට පැවතීම.
    2. පෙර අපර දෙදිග මුහුදු ගමන් මාර්ගයේ කේන්ද්‍රගතව ලංකාව පිහිටා තිබීම.
    3. ජාත්‍යන්තර වෙළඳාමේ දී ස්වාධීන රටක් ලෙස කටයුතු කිරීමේ අවශ්‍යතාව මතුවීම.
    4. අසල්වැසි රටවල් සමග සබඳතා වර්ධනය කරගැනීම සඳහා ය.

09. පහත I තීරුවේ සඳහන් තොරතුරු සමග II තීරුවේ සඳහන් තොරතුරු ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| i. කොතුරු ගැ නා | A. රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානි |
| ii. නගරවුඩික | B. වෙළඳ කටයුතු භාර ප්‍රධානි |
| iii. පන අදෙක | C. චත්සිරිත් හා චාරිත්‍ර පිළිබඳ අධිකාරි |
| iv. කනපෙඩික | D. නාගරික වාස්තු විද්‍යාඥ |

1. CADB 2. CDBA 3. ABCD 4. BDAC

10. ලංකාවේ වෙළඳාම් සඳහා ග්‍රීක් මැසිඩෝනියන් ප්‍රදේශවලින් පැමිණි වෙළඳ කණ්ඩායම් හඳුන්වා ඇත්තේ,
1. අයෝනියන්වරු නමිනි. 2. කාම්බෝජවරු නමිනි.
3. ජාවකවරු නමිනි. 4. නානාදේසින් නමිනි.

11. විහාරස්ථානවල නායක ස්වාමීන් වහන්සේලා සමීපයේ වැඩ වාසය කළ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පැරණි මූලාශ්‍ර වල හඳුන්වා ඇති නාමය කුමක් ද?
1. අන්තේවාසික 2. භාණකවරු 3. ථෙර 4. සදිවිහරිය

12. I විජයබාහු රජු විසින් පොලොන්නරු දළදා මාලිගාවේ ආරක්ෂාව බාරකරන ලද වේලක්කාර කුලී හමුදාව ඉන්දියාවේ කුමන ප්‍රදේශයක සිට මෙහි පැමිණි පිරිසක් ද?
1. කාම්බෝජ 2. කේරල 3. පාණ්ඩ්‍ය 4. චෝල

13. මල් 21 ක් පමණ කැටයම් කර ඇති වී ඇටයක ප්‍රමාණයේ රන් තැල්ලක කොටසක් හමු වූ ස්ථානය වන්නේ,
1. බෙරගල යි. 2. අභයගිරිය යි. 3. ජේතවනාරාමය යි. 4. ඉබ්බන්කටුව යි.

14. අතීත ශ්‍රී ලංකාවේ බර මැනීමට හා දුර මැනීමට භාවිතා කළ මිනුම් ක්‍රම 2 ක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
1. ධරණ හා ස්වර්ණ 2. ගුන්ජා හා ආංගුල
3. තජ්ජාරි හා ධරණ 4. ලිබ්බ හා උබ

15. III උදය රජු විසින් පරිසර සංරක්ෂණය කිරීමේ අරමුණින් "වල්වල දඬුපත් නොකපනු ඉසා" යනුවෙන් නීතියක් පනවමින් පිහිටවූ සෙල්ලිපිය කුමක් ද?
1. කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය 2. මිහින්තලා පුවරු ලිපිය
3. බුද්ධන්නෙහෙල සෙල්ලිපිය 4. වේවැල්කැටිය සෙල්ලිපිය

16. ජාවක චන්ද්‍රභානුගේ ආක්‍රමණ දෙකක් මර්ධනය කරමින් ශ්‍රී ලංකාවේ දේශපාලන ස්ථාවරත්වයක් ඇති කිරීමට කටයුතු කළ පාලකයා කව්ද?
1. II පරාක්‍රමබාහු රජතුමා 2. මහා පරාක්‍රමබාහු රජතුමා
3. IV පරාක්‍රම රජතුමා 4. VI පරාක්‍රමබාහු රජතුමා

17. පහත සඳහන් නිර්මාණ අතරින් පාණ්ඩ්‍ය හා කාම්බෝජ කලාවන්ගේ ආභාෂය ලබාගනිමින් ඉදිකර ඇති නිර්මාණය තෝරන්න.
1. ඉසුරුමුණියේ කැටයම් 2. සත්මහල් ප්‍රාසාදය
3. ගල්විහාරයේ ප්‍රතිමා 4. යාපහුව පියගැටපෙළ

18. vi වන බුවනෙකබාහු රජු විසින් පිහිටුවන ලද දැදිගම අභයදාන ශිලා ලිපිය මගින් නිදහස ලබාදුන් ප්‍රභුවරයෙකු වන්නේ මේ අතරින් කවුරුන් ද?
1. වීරසුන්දර බණ්ඩාර 2. කැකුළන්දල සිරිවර්ධන පතිරාජ
3. නිශ්ශංක අලකේශ්වර 4. අම්බුළුගල කුමාරයා

19. - මෙරට කපු වගාව දියුණු කිරීමට කටයුතු කිරීම.
- බුරුම දේශයෙන් උපසම්පදාව වැඩම කරවීම.
- දෙල්ගමු විහාරයේ තැන්පත් කර තිබූ දන්ත ධාතූන් වහන්සේ මහනුවරට වැඩම කරවීම.

ඉහත සිදුවීම් හා සම්බන්ධ පාලකයා තෝරන්න.

1. I රාජසිංහ 2. I විමලධර්මසූරිය 3. කීර්ති ශ්‍රී රාජසිංහ 4. II විමලධර්මසූරිය

20. මහනුවර රාජධානි සමයේ බද්දේ සංවිධානයට අයත් රෙදි වියන්නන්ගේ කාර්යංශය වන්නේ,
1. රදා බද්ද යි. 2. කුරුවෙ බද්ද යි. 3. මඩිගෙ බද්ද යි. 4. හැඳ බද්ද යි.

21. පහත සඳහන් යුග අතරින් වැඩවසම් සමාජ ක්‍රමයක් දක්නට ලැබුනේ,
1. පුරාතන යුගයේදී ය. 2. මධ්‍යතන යුගයේදී ය.
3. පුනරුද යුගයේදී ය. 4. ගෝත්‍රික යුගයේදී ය.

22. නූතන තාරකා විද්‍යාවේ පියා යන අන්වර්ථ නාමයෙන් හඳුන්වනු ලබන්නේ කවුරුන් ද?
1. ගැලිලියෝ ගැලිලි 2. ජොහැන්නස් කෙප්ලර්
3. නිකලස් කොපර්නිකස් 4. ජොහැන්නස් ගුටෙන්බර්ග්

23. ක්‍රි.ව.1521 වර්ෂයේ සිදු වූ විජයබා කොල්ලයෙන් අනතුරුව කෝට්ටේ පාලකයා බවට පත්වූයේ කවුරුන් ද?
1. මායාදුන්නේ රජු 2. VII බුවනෙකබාහු රජු
3. VI විජයබාහු රජු 4. ධර්මපාල රජු

24. යාපන රාජධානියේ බලය පෘතුගීසින් යටතට පත්වීමට බලපෑ හේතු සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
1. සංකිලි රජු ගිවිසුමක් මගින් පෘතුගීසින්ට පවරා දීම.
2. ස්වභාවික රැකවරණයක් නොතිබීම.
3. ප්‍රමාණවත් නිත්‍ය හමුදාවක් නොතිබීම.
4. යාපන රාජ්‍ය උරුමකරුවන් අතර බල අරගලය

- පහත වගුව ඇසුරෙන් අංක 25 හා 26 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | පුද්ගලයා | සොයාගැනීම | ක්ෂේත්‍රය |
|---|---|---|---|
| | A. ජේම්ස් හාග්‍රිව්ස් | D. වාෂ්ප එන්ජිම | G. වානේ නිපදවීම |
| | B. හෙන්රි බෙසමර් | E. ජෙනී යන්ත්‍රය | H. බලශක්ති උත්පාදනය |
| | C. ජේම්ස් වොට් | F. විවෘත උදුන් ක්‍රමය | I. පේෂ කර්මාන්තය |

25. ගල් අඟුරු කර්මාන්තය සම්බන්ධ තොරතුරු පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.
1. AEG 2. BDH 3. CDH 4. CDG

26. පේෂකර්මාන්තය හා සම්බන්ධ තොරතුරු පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. ADG 2. AEI 3. BFI 4. CDH

27. ක්‍රි.ව.1848 නිදහස් අරගලයෙන් අනතුරුව, නඩු අසා වරදකරු බවට පත්කොට කස පහර සියයක් ලබා දී මෙරටින් පිටුවහල් කළ කැරලි නායකයා කවුරුන් ද?
1. ඇහැලේපොල 2. හඟුරන්කෙත ඩිංගිරාල
3. පුරන් අප්පු 4. ගොංගාලේගොඩ බණ්ඩා

28. ශ්‍රී ලංකාවේ බිහි වූ පළමු බෞද්ධ මුද්‍රණාලය කුමක් ද?
1. කවටකතික 2. සුදර්ශන
3. ලංකෝපකාර 4. ලංකාභිනව විශ්‍රැත

- පහත A,B,C හා D යටතේ දක්වා ඇති එක් එක් යුගලයෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂා කර බලා අංක 29 සිට 31 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A- 1. ලුණු හා කුරුඳු ඒකාධිකාරිය අහෝසි කිරීම.
2. පෞද්ගලික අංශයේ ව්‍යාපාර දිරි ගැන්වීම.

B- 1. කෝපි වගාව
2. හෙමලියා වෙස්ටර්ට්‍රික්ස්

C- 1. ගම්සභාව
2. රාජකාරි ශ්‍රම ක්‍රමය

D- 1. මහා පරිමාණ වතු වගාව
2. දේශීය ස්වයංපෝෂිත කෘෂිකර්මාන්තය

29. පළමුවැන්න, දෙවැන්නේ වර්ධනයට හේතු වූ බව පෙන්වන පද යුගලය අයත් පිළිතුර තෝරන්න.
1. A 2. B 3. C 4. D

30. දෙවැන්නේ පිරිහීමට, පළමුවැන්න හේතු වූ බව දැක්වෙන පද යුගලය අයත් පිළිතුර තෝරන්න.
1. A 2. B 3. C 4. D

31. දෙවැන්න ක්‍රියාත්මක කිරීමට පළමුවැන්නේ සහය අවශ්‍ය බව දැක්වෙන පද යුගලය අයත් පිළිතුර තෝරන්න.
1. A 2. B 3. C 4. D

32. ඓතිහාසික සිදුවීම් කිහිපයක් පහත දැක්වේ. එම සිදුවීම් කාල අනුපිළිවෙළ අනුව ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.
A - තෝමස් මේට්ලන්ඩ්ගේ ලංකාගමනය
B - මුඩුබිම් පනත
C - මැක්ඩෝවල් සෙනෙවියාගේ උඩරට ආක්‍රමණය
D - ද මියුරන් කොමිසම පත් කිරීම.

1. ABCD 2. BACD 3. CBDA 4. DCAB

33. දෙවන ජනරජ ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය නායකයා ලෙස විධායක ජනාධිපතිවරයාට හිමි බලතලයක් වන්නේ,
1. පාර්ලිමේන්තුව කැඳවීම හා වාර අවසාන කිරීම යි.
2. අගමැතිවරයා පත් කිරීම යි.
3. යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම යි.
4. ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීම යි.

- පහත ප්‍රකාශ ඇසුරින් අංක 34-35 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න
A - ජෝර්ජ් වොෂින්ටන් ගේ නායකත්වය
B - ටෙනිස් පිටියේ දිවුරුම

34. ඇමරිකන් නිදහස් සටන සම්බන්ධයෙන්,
1. A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
2. A හා B සත්‍ය වේ.
3. A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
4. A හා B අසත්‍ය වේ.

35. ප්‍රංශ විප්ලවය සම්බන්ධයෙන්,
1. A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
2. A හා B දෙකම සත්‍ය වේ.
3. A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
4. A හා B දෙකම අසත්‍ය වේ.

36. I තීරුවේ දැක්වෙන ප්‍රකාශ II තීරුවේ සිද්ධීන් සමග ගැලපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. බොස්ටන් තේ සාදය | A. I ලෝක සංග්‍රාමය |
| 2. සමාජවාදී දර්ශනය ව්‍යාප්ත වීම | B. ඇමරිකානු විප්ලවය |
| 3. ප්‍රාන්ස් ෆර්ඩිනන්ඩ් කුමරු ඝාතනය | C. රුසියන් විප්ලවය |
| 4. පර්ල් වරායට පහරදීම | D. II ලෝක සංග්‍රාමය |
| | E. ප්‍රංශ විප්ලවය |

1. BCAD 2. BEAD 3. BECD 4. DCAE

37. වර්තමානයේදී පවා බිහිසුනු අත්දැකීම් ලබාදෙන දෙවන ලෝක යුද සමයේ ඇති වූ දරුණුතම සිදුවීම මේ අතරින් කුමක් ද?
 1. අක්ෂ බලවතුන් හට පරාජය හිමිවීම.
 2. මිලියන 50කට මිනිස් ජීවිත ප්‍රමාණයක් විනාශ වීම.
 3. හිට්ලර් යුදෙව්වන් විශාල ප්‍රමාණයක් සමූල ඝාතනය කිරීම.
 4. හිරෝෂිමා නාගසාකි නගරවලට පරමාණු බෝම්බ හෙලීම.

38. පහත සඳහන් රටවල් අතරින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජිකත්වය දරණ රට වන්නේ,
 1. ජපානය යි. 2. ඉන්දියාව යි. 3. චීනය යි. 4. ජර්මනිය යි.

39. II ලෝක සංග්‍රාම අවධියේ දී බ්‍රිතාන්‍යයේ අගමැතිවරයා ලෙස කටයුතු කරන ලද්දේ කව්ද?
 1. ලොයිඩ් ජෝර්ජ් 2. ක්ලෙමන්ට් ෂෝ
 3. විටෝරියා ඔලැන්ඩෝ 4. විල්සන්ට් චර්චිල්

40. මාර්ෂල් සැලැස්ම යනු,
 1. නැවත ලෝක මහා සංග්‍රාම ඇතිවීම වැලැක්වීම සඳහා පිහිටවූ සංවිධානයකි.
 2. බ්‍රිතාන්‍ය විසින් හඳුන්වා දෙන ලද ආධාර වැඩපිළිවෙළකි.
 3. විනාශයට පත් යුරෝපය පරාජිත රටවල් නගා සිටුවීමට ඉදිරිපත් කළ වැඩසටහනකි.
 4. ජර්මනියට දැඩි දඬුවම් පැනවීමට ගත් ක්‍රියාමාර්ගයකි.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved



# අ.පො.ස.(සා.පෙළ) විභාගය- 2023 (2024)

## පෙරහුරු පරීක්ෂණය - ඉතිහාසය - II

**කාලය පැය 3 මිනිත්තු 10**

**උපදෙස් :**

- I කොටසේ ප්‍රශ්න අංක 01 අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද, පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

---

## I කොටස

1. (අ) i. පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.

මාතොට, අලිමංකඩ, මැණික් ගඟ, දැදුරු ඔය, ඇලහැර අමුණ, නාච්චදූව වැව, හලාවත, ඌරාතොට, ගොඩවාය, සෙංකඩගල, තිරුකේතීශ්වරම්, පඬුවස්නුවර

(ලකුණු 12)

ii. පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

කැලිකට්, පර්සියන් බොක්ක, පෘතුගාලය, ජිනෝවා, පිලිපීන් දූපත්, බුරුමය

(ලකුණු 06)

(ආ) i. පහත A,B,C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාල පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A. චේර රාජ්‍යයේ පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට සහභාගී වූ ලම්බකර්ණ වංශික පාලකයා
B. දඹදෙණිය දළදා මාළිගය ඉදි කරවූ පාලකයා
C. ලංකා ජාතික සංගමයේ ආරම්භක සභාපතිවරයා
D. මුල්ම වරට ගුවානෝ පොහොර නිපදවූ රට

(ලකුණු 04)

- පහත A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ii. 1. මෙම ඡායාරූපයෙන් දැක්වෙන දාගැබ හඳුනාගෙන නම් කරන්න.
2. මෙම දාගැබ ඉදි කරවන ලද පාලකයා කවුරුන් ද?
3. එම දාගැබ වටා ගල්කණු සිටුවා ඒ මත වහලයක් ඉදිකර එහි ආරක්ෂාවට ඉදිකර තිබූ ගොඩනැගිල්ල හඳුන්වන්නේ කුමන නමකින් ද?
4. මෙම දාගැබ දැකිය හැකි පැරණි නගරය නම් කරන්න.

A



(ලකුණු 04)

iii. 1. මෙම ඡායාරූපයෙන් දැක්වෙන පුද්ගලයා හඳුනාගෙන නම් කරන්න.
2. ඔහුගේ නායකත්වය හිමි වූ දේශපාලන පක්ෂය මුලින්ම හැඳින්වූ නම කුමක් ද?
3. ඔහු කිනම් දේශපාලන විප්ලවයක් හා සම්බන්ධ පුද්ගලයෙක් ද?
4. එම විප්ලවයෙන් පසු එම රාජ්‍ය හැඳින්වූ නම කුමක් ද?

B



(ලකුණු 04)

## II කොටස

2\. i. ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ මානවයා ශිලා මෙවලම් තනාගැනීමට භාවිතා කළ පාෂාණ වර්ග 03 ක් නම් කරන්න. (ලකුණු 03)

ii. පූර්ව ඓතිහාසික යුගයට අයත්,

A - ශිලා මංජුසා සොහොන් හමු වූ ස්ථාන දෙකක් හා

B - මැටි ඔරු සුසාන පිහිටි ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 04)

iii. පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ ජීවන රටාවේ මූලික ලක්‍ෂණ දෙකක් නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

iv. මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල මූලික ලක්‍ෂණ තුනක් නම් කර විස්තර කරන්න. (ලකුණු 06)

3\. i. ගමක නායකයා ලෙස ගමිකවරයා ගම නියෝජනය කරමින් සහභාගී වූ අවස්ථා 03 ක් නම් කරන්න. (ලකුණු 03)

ii. පහත A,B,C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A. තොටබෝජක නම් පරුමක වරයෙක් පිළිබඳ තොරතුරු සඳහන් සෙල්ලිපිය

B. සෙල්ලිපිවල ධීවරයන් විසූ ගම්මාන හැඳින්වූ නම

C. ගමිකයන් ගෘහපතින් අතරින්ම තේරිපත් වූ බවට තොරතුරු සඳහන් බුද්ධඝෝෂ හිමියන් විසින් රචිත කෘතිය

D. "පර්වතරාජ" සංකල්පයෙන් හඳුන්වන ලබන අනුරාධපුර යුගයේ පාලකයා

(ලකුණු 04)

iii. ලංකා ඉතිහාසයේ වැදගත් පාලකයෙකු වූ දුටුගැමුණු රජතුමාගෙන් සිදු වු දේශපාලන සේවාවන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

iv. අතීත ශ්‍රී ලංකාවේ විවිධ ජන කොටස් සහජීවනයෙන් යුක්තව ජීවත් වූ බව උදාහරණ 03 ක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

4\. i. පොළොන්නරු රාජධානි සමයේ දී අගනගරය ආශ්‍රිතව ඉදි කරන ලද දාගැබ් 03 ක් නම් කරන්න. (ලකුණු 03)

ii. සීගිරි ජලමල් ඉදි කිරීමේ දී අනුගමනය කළ තාක්‍ෂණික ක්‍රම 02 ක් නම් කරන්න. (ලකුණු 04)

iii. ශ්‍රී ලංකාවේ අතීත පාලකයින් ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් දියුණු කිරීමට ගත් ක්‍රියාමාර්ග දෙකක් නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

iv. ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ කාන්තාවන්ට වැදගත් ස්ථානයක් හිමිව තිබූ බව උදාහරණ ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

5\. i. ශ්‍රී ලංකාවේ දෙවන නාගරීකරණයට අයත් මුල් රාජධානි තුනෙහි ආරම්භක පාලකයින් තිදෙනා අනුපිළිවෙළින් නම් කරන්න. (ලකුණු 03)

ii. පහත සඳහන් පාලකයින්ට අදාල සිදුවීම් වරන් තුළින් තෝරා A,B,C හා D අනුපිළිවෙළින් ලියන්න.

A. තුන්වන බුවනෙකබාහු B. සිව්වන විජයබාහු

C. නිශ්ශංක අලකේශ්වර D. අටවන වීර පරාක්‍රමබාහු

(පෘතුගීසින්ගේ ලංකාගමනය, යාපා පටුන ජයගැනීම, කෝට්ටේ කොටුව ඉදිකරවීම, රජවාසල කුමන්ත්‍රණයකින් මිය යාම, කුරුණෑගල වැව කරවීම) (ලකුණු 04)

iii. රජරට ශිෂ්ටාචාරය බිඳවැටීමෙන් පසු මෙරට ආර්ථිකයේ සිදු වූ වෙනස්කම් දෙකක් නම් කර විස්තර කරන්න. (ලකුණු 05)

iv. හයවන පැරකුම් රජුගේ අවධියේ සිදුවූ වැදගත් දේශපාලන සිදුවීම් තුනක් නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

6. i. මහනුවර රාජධානියේ බලයට පත් මුල්ම නායක්කර් වංශික පාලකයන් තිදෙනා නම් කරන්න. (ලකුණු 03)

ii. මහනුවර රාජධානි සමයේ දී මහවාසල හෙවත් මාලිගාවේ පරිපාලන කටයුතු හා සම්බන්ධ වූ නිලධාරීන් සිව් දෙනෙකු නම් කරන්න. (ලකුණු 04)

ii. බ්‍රිතාන්‍ය ජාතිකයන්ගේ අවධානය ලංකාව කෙරෙහි යොමුවීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iii. බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

7. i. මදුරාසි පාලනය යටතේ ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනයට පත් කරන ලද නිළධාරීන් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

ii. පහත සඳහන් දේශපාලන වෙනස්කම් සිදු වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයන් A,B,C හා D පිළිවෙළින් නම් කරන්න.

A. ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් සාමාජික සංඛ්‍යාව බහුතරය බවට පත්වීම.

B. ආණ්ඩුකාර ධූරය ස්ථාපිත කිරීම

C. උඩරට හා පහතරට ඒකාබද්ධ පාලනයක් ඇති කිරීම.

D. සීමිත ඡන්ද ක්‍රමය හඳුන්වා දීම. (ලකුණු 04)

iii. 49 ක්‍රි.ව.1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණයන් දෙකක් නම් කර කෙටියෙන් නම් විස්තර කරන්න. (ලකුණු 05)

iv. නිදහසින් පසු බිහි වූ රජයන් මෙරට කාර්මික අංශය දියුණු කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග තුනක් නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

## III කොටස

8. i. කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයෙන් ම ආරම්භ වීමට බලපෑ හේතු 03 ක් නම් කරන්න. (ලකුණු 03)

ii. කාර්මික විප්ලවයට පෙර අවධියේ දී ගල් අඟුරු පතල්, කාර්මිකයන් මුහුණ දුන් ගැටලු 04 ක් නම් කරන්න. (ලකුණු 04)

iii. කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස ලෝක ආර්ථික ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. කාර්මික විප්ලවයේ බලපෑම නිසා ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුණුවක් ඇති වීමට බලපෑ හේතු තුනක් නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

9. i. ප්‍රංශ විප්ලවය ඇතිවීමට බලපෑ මතවාදයක් ඉදිරිපත් කළ දාර්ශනිකයන් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

ii. ප්‍රංශ විප්ලවයට බලපෑ සමාජ හේතු 4 ක් නම් කරන්න. (ලකුණු 04)

iii. පළමු ලෝක මහා සංග්‍රාමය ඇතිවීමට බලපෑ හේතු දෙකක් නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. දෙවන ලෝක සංග්‍රාමයේ ප්‍රතිඵල තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

## පිළිතුරු පත්‍රය- ඉතිහාසය- වයඹ පලාත් පෙරහුරු ප්‍රශ්න පත්‍රය -2024.03.18

### I පත්‍රය


| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1 | 3 | 11 | 4 | 21 | 2 | 31 | 3 |
| 2 | 1 | 12 | 2 | 22 | 3 | 32 | 4 |
| 3 | 2 | 13 | 3 | 23 | 2 | 33 | 3 |
| 4 | 4 | 14 | 1 | 24 | 1 | 34 | 1 |
| 5 | 2 | 15 | 3 | 25 | 3 | 35 | 3 |
| 6 | 1 | 16 | 1 | 26 | 2 | 36 | 1 |
| 7 | 2 | 17 | 4 | 27 | 4 | 37 | 4 |
| 8 | 3 | 18 | 2 | 28 | 3 | 38 | 3 |
| 9 | 2 | 19 | 2 | 29 | 1 | 39 | 4 |
| 10 | 1 | 20 | 4 | 30 | 4 | 40 | 3 |

### II පත්‍රය

1. (අ) i. පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.

මාතොට, අලිමංකඩ, මැණික් ගඟ, දැදුරු ඔය, ඇලහැර අමුණ, නාච්චදූව වැව, හලාවත, ඌරාතොට, ගොඩවාය, සෙංකඩගල, තිරුකේතීශ්වරම්, පඬුවස්නුවර


(ලකුණු 12)



ii. පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

කැලිකට්, පර්සියන් බොක්ක, පෘතුගාලය, ජිනෝවා, පිලිපීන් දූපත්, බුරුමය

(ලකුණු 06)




(ආ) i. පහත A,B,C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාල පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A. චේර රාජ්‍යයේ පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට සහභාගී වූ ලම්බකර්ණ වංශික පාලකයා

■ **පළමු ගජබාහු රජතුමා**

B. දඹදෙණිය දළදා මාළිගය ඉදි කරවූ පාලකයා

■ **දෙවන පැරකුම් රජතුමා**

C. ලංකා ජාතික සංගමයේ ආරම්භක සභාපතිවරයා

■ **පොන්නම්බලම් අරුණාචලම් මහතා**

D. මුල්ම වරට ගුවානෝ පොහොර නිපදවූ රට

■ **දකුණු අප්‍රිකාව** (ලකුණු 04)

- පහත A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ii. 1. මෙම ඡායාරූපයෙන් දැක්වෙන දාගැබ හඳුනාගෙන නම් කරන්න.

■ **ථූපාරාමය**

2. මෙම දාගැබ ඉදි කරවන ලද පාලකයා කවුරුන් ද?

■ **දේවානම් පියතිස්ස රජතුමා**

3. එම දාගැබ වටා ගල්කණු සිටුවා ඒ මත වහලයක් ඉදිකර එහි ආරක්ෂාවට ඉදිකර තිබූ ගොඩනැගිල්ල හඳුන්වන්නේ කුමන නමකින් ද?

■ **වටදාගෙය**



A

4. මෙම දාගැබ දැකිය හැකි පැරණි නගරය නම් කරන්න. ■ **අනුරාධපුරය**

(ලකුණු 04)

iii. 1. මෙම ඡායාරූපයෙන් දැක්වෙන පුද්ගලයා හඳුනාගෙන නම් කරන්න.

■ **වී.අයි.ලෙනින්**



B

2. ඔහුගේ නායකත්වය හිමි වූ දේශපාලන පක්ෂය මුලින්ම හැඳින්වූ නම කුමක් ද? ■ **බෝල්ෂෙවික් පක්ෂය**

3. ඔහු කිනම් දේශපාලන විප්ලවයක් හා සම්බන්ධ පුද්ගලයෙක් ද?

■ **රුසියන්**

4. එම විප්ලවයෙන් පසු එම රාජ්‍ය හැඳින්වූ නම කුමක් ද?

■ **සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය**

## II පත්‍රය

## II කොටස

2. i. ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ මානවයා ශිලා මෙවලම් තනාගැනීමට භාවිතා කළ පාෂාණ වර්ග 03 ක් නම් කරන්න. (ලකුණු 03)

- **කළුගල්**
- **කහඳ ගල්**
- **තිරිවානා ගල්**

ii. පූර්ව ඓතිහාසික යුගයට අයත්,

A - ශිලා මංජුසා සොහොන් හමු වූ ස්ථාන දෙකක් හා

- **ඊබ්බන්කටුව**
- **යාපහුව ගල්සොහොන් කනත්ත**
- **යටිගල්පොත්ත**

B - මැටි ඔරු සුසාන පිහිටි ස්ථාන දෙකක් නම් කරන්න.

- **රංචාමඩම පාසල් භූමිය**
- **බෙරගල**
- **හල්දුම්මුල්ල**

(ලකුණු 04)

iii. පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ ජීවන රටාවේ මූලික ලක්ෂණ දෙකක් නම් කර කෙටියෙන් විස්තර කරන්න.

- . **දඩයම් කිරීමෙන් සහ තැන තැන ඇවිද ආහාරයට ගත හැකි ස්වාභාවික දේ එකතු කර ගනිමින් ජීවිකාව පවත්වා ගෙන යාම**
- **වර්ෂයේ වැඩි කාලයක් සංචාරක ජීවිතයක් ගත කිරීම**
- **එළිමහනේ ජීවත්වීමට වැඩි කැමැත්තක් දැක්වීම හා වර්ෂාධික කාලවල දී ස්වාභාවික ගල්ගුහාවල ජීවත් වීම**
- **කුඩා කණ්ඩායම් ලෙස සංවිධානය වී සිටීම**
- **මියගිය ඥාතීන්ගේ මළසිරුරු ගුහා ඇතුළත වළ දැමීම හා අවමංගල අභිචාර විධි අනුගමනය**

(ලකුණු 05)

iv. මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල මූලික ලක්ෂණ තුනක් නම් කර විස්තර කරන්න. (ලකුණු 06)

- **ඓතිහාසික යුගයේ ජනාවාස බහුතරය වැවක් කේන්ද්‍ර කොට ගනිමින් එහි ආසන්නයේ ම පැවතීම**
- **වැව් බැම්මේ එක් කෙළවරක වැවට නුදුරු ව ගම් පිහිටා තිබීම**
- **ගංගා නිම්නවල වලට පිටතින් පිහිටා තිබීම**
- **වූ ජනාවාස එකිනෙකින් ස්වාධීනව පිහිටා තිබීම**
- **නොයෙකුත් වෘත්තිකයින් විසූ ජනාවාස පිටා තිබීම**
-

3. i. ගමක නායකයා ලෙස ගමිකවරයා ගම නියෝජනය කරමින් සහභාගී වූ අවස්ථා 03 ක් නම් කරන්න.

- **ගම් අතර සිදුවන වෙළෙදාමේ දී/භාණ්ඩ හුවමාරුවේ දී**
- **ආවාහ විවාහ කටයුතු වලදී**
- **ගම් අතර සිදුවන ආරවුල් විසදීමේ දී**
-

(ලකුණු 03)

ii. පහත A,B,C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A. තොටබෝජක නම් පරුමක වරයෙක් පිළිබඳ තොරතුරු සඳහන් සෙල්ලිපිය

- **කණ්ඩලම කොත්ගල්කන්ද ලිපිය**

B. සෙල්ලිපිවල ධීවරයන් විසූ ගම්මාන හැඳින්වූ නම

- **කේවට්ටගාම**

C. ගමිකයන් ගෘහපතින් අතරින්ම තේරීපත් වූ බවට තොරතුරු සඳහන් බුද්ධඝෝෂ හිමියන් විසින් රචිත කෘතිය

- **සමන්තපාසාදිකාව**

D. "පර්වතරාජ" සංකල්පයෙන් හඳුන්වන ලබන අනුරාධපුර යුගයේ පාලකයා

- **පළමුවන කාශ්‍යප**

(ලකුණු 04)

iii. ලංකා ඉතිහාසයේ වැදගත් පාලකයෙකු වූ දුටුගැමුණු රජතුමාගෙන් සිදු වු දේශපාලන සේවාවන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

- **ඉතිහාසයේ ප්‍රථම සංවිධානාත්මත සටන් ව්‍යාපාරයට නායකත්වය**
- **ලංකාව පළමු වතාවට එක්සේසත් කිරීම**
- **පරිපාලනය විධිමත් කිරීම සඳහා දසමහා යෝධයින්ට/පරුමක වරුන්ට නිලතල ප්‍රදානය**

(ලකුණු 05)

iv. අතීත ශ්‍රී ලංකාවේ විවිධ ජන කොටස් සහජීවනයෙන් යුක්තව ජීවත් වූ බව උදාහරණ 03 ක් ඇසුරින් විස්තර කරන්න.

- **10 ශ්‍රේණිය පෙළපොත 60 පිටුව වාර්ගික සහජීවනය ඇසුරෙන්**

(ලකුණු 06)

4. i. පොළොන්නරු රාජධානි සමයේ දී අගනගරය ආශ්‍රිතව ඉදි කරන ලද දාගැබ් 03 ක් නම් කරන්න.

- **කිරිවෙහෙර**
- **රංකොත්වෙහෙර**
- **දෙමළ මහා සෑය ආදී**

(ලකුණු 03)

ii. සීගිරි ජලමල් ඉදි කිරීමේ දී අනුගමනය කළ තාක්ෂණික ක්‍රම 02 ක් නම් කරන්න.

- **කාණු පද්ධතියක් හරහා තැනිතලාවට ගලා එන ජලය හිටිවන ම හරස් කොට සැලකිය යුතු තරමේ පීඩනයක් ඇති කිරීමෙන් ජලය ඉහළට එසවීම**

- **ස්වාභාවික ව ජනනය වන පීඩනය නිසා ඉහළට එසවෙන ජල කඳේ උස වෙනස් කිරීම සඳහා යොදා ගෙන තිබෙන උපක්‍රමය වන්නේ පීඩනය උපදින තැනට ඉහළින් තිබෙන ගල් පතුරේ විද තිබෙන සිදුරුවල විෂ්කම්භය වෙනස් කිරීම**
- **පර්වතයේ ඉහළ සිට පහළට ජලය ගලාගෙන පැමිණීමේ දී ඊට මුසු වන රොන්මඩ ස්වාභාවික ගුරුත්ව බලයෙන් පහළට කිඳා බැසීමට ජලය වැඩි දුරක් අඩු බැස්මකින් යුතුව ගලා යාමට හැකි වන පරිදි සීගිරියේ ජල උද්‍යානයේ කාණු පද්ධතිය දඟරාකාර ව සකස් කර තිබීම**

(ලකුණු 04)

iii. ශ්‍රී ලංකාවේ අතීත පාලකයින් ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් දියුණු කිරීමට ගත් ක්‍රියාමාර්ග දෙකක් නම් කර කෙටියෙන් විස්තර කරන්න.

- **රෝහල් ඉදිකිරීම,වෛද්‍යවරු පත්කිරීම,රෝහල් නඩත්තුවට ගම්වර පූජාව**
- **වැසිකිළි කැසිගිළි ඉදිකිරීම**
- **පානීය හාවෙනත් ජල අවශ්‍යතා සඳහා ළිං /පොකුණු /වැව /ඇළ මාර්ග ඉදිකරවීම**
- **කසළ කළමනාකරණයට හා බැහැර කිරීමට කාණු පද්ධති ඉදිකිරීම** (ලකුණු 05)

iv. ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ කාන්තාවන්ට වැදගත් ස්ථානයක් හිමිව තිබූ බව උදාහරණ ඇසුරින් විස්තර කරන්න.

- **පරුමකවරුන් /පරුමකලු ලෙස සේවය කිරීම**
- **රාජ්‍ය උරුමය ලබාගෙන රාජ්‍ය පාලන කටයුතුවල නිරත විම**
- **ඉඩම් හිමිකම** (ලකුණු 06)

5. i. ශ්‍රී ලංකාවේ දෙවන නාගරීකරණයට අයත් මුල් රාජධානි තුනෙහි ආරම්භක පාලකයින් තිදෙනා අනුපිළිවෙළින් නම් කරන්න.

- **තුන්වන විජයබාහු**
- **පළමු බුවනෙකබාහ**
- **දෙවන බුවනෙකබාහු** (ලකුණු 03)

ii. පහත සඳහන් පාලකයින්ට අදාල සිදුවීම් වරන් තුළින් තෝරා A,B,C හා D අනුපිළිවෙළින් ලියන්න.

A. තුන්වන බුවනෙකබාහු - **කුරුණෑගල වැව කරවීම**
B. සිව්වන විජයබාහු - **රජවාසල කුමන්ත්‍රණයකින් මිය යාම**
C. නිශ්ශංක අලකේශ්වර - **කෝට්ටේ කොටුව ඉදිකරවීම,**
D. අටවන වීර පරාක්‍රමබාහු - **පෘතුගීසින්ගේ ලංකාගමනය**

(ලකුණු 04)

iii. රජරට ශිෂ්ටාචාරය බිඳවැටීමෙන් පසු මෙරට ආර්ථිකයේ සිදු වූ වෙනස්කම් දෙකක් නම් කර විස්තර කරන්න.

- **තෙත් කලාපයට වර්ෂාව හොඳින් ලැබුණු බැවින් මහ වැව් හා වාරි මාර්ග ඉදි කිරීමට වැඩි අවධානයක් යොමු නොකිරීම**
- **කෘෂිකාර්මික කටයුතු සඳහා අහස් දිය යොදා ගැනීම**
- **ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය**
- **වාණිජ ආර්ථික රටාවකට නැඹුරු වීම** (ලකුණු 05)

iv. හයවන පැරකුම් රජුගේ අවධියේ සිදුවූ වැදගත් දේශපාලන සිදුවීම් තුනක් නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

- **වන්නි ප්‍රදේශ කෝට්ටේ රාජ්‍යයට යටත් කිරීම**
- **සපුමල් කුමාරයා යටතේ හමුදාව යවා යාපනය ජය ගැනීම**
- **උඩරට සාමන්ත පාලකයා වූ ජෝතිය සිටුවරයා ඇති කළ කැරැල්ල මැඩ පැවැත්වීම**
- **කෝට්ටේ රාජධානිය යටතේ රට එක්සත් කොට ආර්ථික වශයෙන් රට සමෘද්ධිමත් කිරීම**

6. i. මහනුවර රාජධානියේ බලයට පත් මුල්ම නායක්කර් වංශික පාලකයන් තිදෙනා නම් කරන්න.

- **විජය රාජසිංහ**
- **කීර්ති ශ්‍රී රාජසිංහ**
- **රාජාධි රාජසිංහ**

(ලකුණු 03)

ii. මහනුවර රාජධානි සමයේ දී මහවාසල හෙවත් මාලිගාවේ පරිපාලන කටයුතු හා සම්බන්ධ වූ නිලධාරීන් සිව් දෙනෙකු නම් කරන්න.

- **ගජනායක නිලමේ හෙවත් ඇතුන්ගේ කටයුතු භාර තැනැත්තා, මහලේකම්,**
- **මහ ගබඩානිලමෙ,**
- **දියවඩන නිලමෙ,**
- **හළු වඩන නිලමෙ,**
- **බත් වඩන නිලමෙ,**
- **අස් පන්තියෙ මුහන්දිරම්,**
- **කවිකාර මඩුවෙ මුහන්දිරම්** (ලකුණු 04)

ii. බ්‍රිතාන්‍ය ජාතිකයන්ගේ අවධානය ලංකාව කෙරෙහි යොමුවීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

- **වෙළෙදාම් කටයුතු වලදී ඇති වැදගත් කම**
- **පිහිටීමේ වැදගත්කම** (ලකුණු 05)

iii. බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

- **ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම**
- **රාජාණ්ඩු පාලනය බිඳ වැටීම**
- **පරේලිමේන්තු ආණ්ඩුක්‍රමය හඳන්වා දීම**
- **ජනතාවට ඡන්ද අයිතිය හිමි වීම**
- **දේශපාලන පක්ෂ ක්‍රමයක් ඇතිවීම වැනි**

7. i. මදුරාසි පාලනය යටතේ ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනයට පත් කරන ලද නිළධාරීන් තිදෙනෙකු නම් කරන්න.

- **රෙසිඩන්ට්**
- **අවුමිල්දාර්**
- **කලෙක්ටර්** (ලකුණු 03)

ii. පහත සඳහන් දේශපාලන වෙනස්කම් සිදු වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයන් A,B,C හා D පිළිවෙළින් නම් කරන්න.

A. ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් සාමාජික සංඛ්‍යාව බහුතරය බවට පත්වීම.

- **මැනිං**

B. ආණ්ඩුකාර ධූරය ස්ථාපිත කිරීම

- **කොල්බෘක් කැමරන්**

C. උඩරට හා පහතරට ඒකාබද්ධ පාලනයක් ඇති කිරීම.

- **කොල්බෘක් කැමරන්**

D. සීමිත ඡන්ද ක්‍රමය හඳුන්වා දීම.

- **කෲව් මැකලම්** (ලකුණු 04)

iii.ක්‍රි.ව.1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණයන් දෙකක් නම් කර කෙටියෙන් නම් විස්තර කරන්න.

- **එතෙක් ලංකාව යනුවෙන් හැඳින්වූ මෙරට ශ්‍රී ලංකාව යන නාමයෙන් හැඳින්වීම**
- **බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය සමග පැවති ව්‍යවස්ථානුකූල බැඳීම් අවසන් කිරීම**
- **ශ්‍රී ලංකාව ඒකීය ජනරජයක් බව පිළිගැනීම**
- **ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම** (ලකුණු 05)

iv. නිදහසින් පසු බිහි වූ රජයන් මෙරට කාර්මික අංශය දියුණු කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග තුනක් නම් කර කෙටියෙන් විස්තර කරන්න.

- **ගොවිජනපද ව්‍යාපාරය**
- **මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය**
- **1943 දී වී සඳහා සහතික මිල ක්‍රමයක් හඳුන්වා දීම.**
- **වී පර්යේෂණ ආයතන පිහිටුවීම හා නව වී ප්‍රභේද හඳුන්වා දීම - බතලගොඩ**
- **වී අභිජනන මධ්‍යස්ථානය උදහණයකි.**
- **ගොවිජන සේවා මධ්‍යස්ථාන පිහිටුවීම.**
- **රජයේ බැංකු මගින් ගොවියන්ට ණය ආධාර ලබාදීමට පියවර ගැනීම.** (ලකුණු 06)

## III කොටස

8. i. කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයෙන් ම ආරම්භ වීමට බලපෑ හේතු 03 ක් නම් කරන්න.

- **16 වන සියවසේ සිට වෙළෙඳ හා වාණිජ්‍ය කටයුතු දියුණු වීම**
- **කර්මාන්ත සඳහා මුදල් ආයෝජනය කළ හැකි ධනවතුන් පිරිසක් එරට බිහි වීම**
- **බිතාන්‍යයේ හා එහි යටත්විජිතවල ජනගහන වර්ධනය අධික වීම නිසා භාණ්ඩ සඳහා වූ ඉල්ලුම වැඩි වීම**
- **පුනරුදය නිසා විද්‍යාත්මක දැනුමේ පුළුල්වීම**
- **යන්ත්‍ර සූත්‍ර තැනවීමට අවශ්‍ය යකඩ හා වානේ වැනි ඛනිජ සම්පත් බ්‍රිතාන්‍යය සතුව තිබීම**
- **බලශක්තිය සඳහා අවශ්‍ය ගල් අඟු-රු බහුලව තිබීම**
- **ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය වැනි** (ලකුණු 03)

ii. කාර්මික විප්ලවයට පෙර අවධියේ දී ගල් අඟුරු පතල්, කාර්මිකයන් මුහුණ දුන් ගැටලු 04 ක් නම් කරන්න.

- **කැණීමේ දී ආකරවල එකතු වන ජලය ඉවත් කිරීම,**
- **ගැඹුරට කැණීමේ දී ආකර පතුලේ විෂ වායු තිබීම,**
- **ආකර පතුලේ උෂ්ණත්වය වැඩි වීම,**
- **ආකර තුළට ආලෝකය සැපයීම** (ලකුණු 04)

iii. කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස ලෝක ආර්ථික ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

- **කාර්මික නිෂ්පාදන පුළුල්වීම**
- **වෙළෙඳ හා වාණිජ කටයුතු, ආර්ථික ක්ෂේත්‍රයේ පෙරමුණ ගැනීම**
- **සාම්ප්‍රදායික කෘෂි ආර්ථික රටාව පසෙකට තල්ලු වී, ආනයන අපනයන වෙළෙඳ ආර්ථිකය ඉදිරියට පැමිනීම**
- **ධනවාදි ආර්ථික රටාව වේගයෙන් ලොව පුරා ව්‍යාප්ත වීම**
- **බද්ද ව්‍යාපාර සමාගම් බිහි කර ගැනිම ආදී** **(ලකුණු 05)**

iv. කාර්මික විප්ලවයේ බලපෑම නිසා ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුණුවක් ඇති වීමට බලපෑ හේතු තුනක් නම් කර කෙටියෙන් විස්තර කරන්න.

- **මහාමාර්ග ඉදිවීම**
- **දුම්රිය මාර්ගඉදිකිරීම**
- **මාර්ග ඉදිකිරීමට මැකඩම් ක්‍රමය යොදාගැනීම**
- **ජල මාර්ග හරහා ලී පාලම් වෙනුවට යකඩ භාවිත කර පාලම් තැනීම** (ලකුණු 06)

9\. i. ප්‍රංශ විප්ලවය ඇතිවීමට බලපෑ මතවාදයක් ඉදිරිපත් කළ දාර්ශනිකයන් තිදෙනෙක් නම් කරන්න.

- **රූසෝ**
- **මොන්ටෙස්ක්‍යු**
- **වෝල්ටෙයා**

(ලකුණු 03)

ii. ප්‍රංශ විප්ලවයට බලපෑ සමාජ හේතු 4 ක් නම් කරන්න.

- **ප්‍රංශයේ පැවැති වැඩවසම් සමජ ක්‍රමය**
- **මධ්‍යම පන්තියට දේශපාලන වශයෙන් වැදගත්කමක් ලැබී නොතිබීම**
- **රදළයන් සතු වූ අධිපතිවාදී බලතල නිසා මධ්‍යම පාන්තිකයෝ කලකිරී සි ටීම**
- **ප්‍රංශ සමාජයේ ධනයෙන් හා උගත්කමින් ඉදිරියෙන් සිටි පිරිස වූයේ මධ්‍යම පන්තිය යි. එහෙත් එම මට්ටම අනුව සමාජයේ තැනක් ඔවුනට හිමි නො වීම වැනි**

(ලකුණු 04)

iii. පළමු ලෝක මහා සංග්‍රාමය ඇතිවීමට බලපෑ හේතු දෙකක් නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

- **ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ දී, ප්‍රංශය හා ජර්මනිය සතුරන් බවට පත් වීම**
- **ජර්මන් අධිරාජයා වූ දෙවන විලියම්ගේ ක්‍රියා කලාපය**
- **යටත් විජිත සඳහා වූ තරගය**
- **අවි තරගය හා ජාතිවාදය වර්ධනය වීම.**
- **ප්‍රංශය යුරෝපය තුළ තනි කිරීමට බිස්මාර්ක් අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තිය**
- **ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරුන් ඝාතනය කිරීම.**

(ලකුණු 05)

iv. දෙවන ලෝක සංග්‍රාමයේ ප්‍රතිඵල තුනක් කෙටියෙන් විස්තර කරන්න.

- **දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් ජර්මනිය, ඉතාලිය හා ජපානය අයත් වූ අක්ෂ පිල පරාජයට පත් විය.**
- **එම යුද්ධය ලෝක ඉතිහාසයේ මෙතෙක් ඇති වූ බිහිසුණු ම සංග්‍රාමය විය. මෙම සංග්‍රාමයේ දී මිනිස් ජීවිත මිලියන 50කට වඩා විනාශ වූ බව සැලකේ. දේපල හා ධන විනාශය ගණනය කළ නො හැකි තරම් ය.**
- **යුදෙව්වන් ඝාතනය කිරීමේ හිට්ලර්ගේ වැඩ පිළිවෙළ අනුව ජර්මනිය, පෝලන්තය,**
- **හංගේරියාව වැනි ජර්මන් බලය පැතිරුණු රටවල යුදෙව්වන් මිලියන ගණනක්**
- **නට්සි හමුදාව විසින් වද කඳවුරුවලට ගාල් කර මරා දමන ලදි.**

**වැනි පෙළපොත 152 පිටුව අනුව** **(ලකුණු 06)**


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න